# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 262 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 13/02/2024<br>පැය 1510 | | |

# මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - ඌරගස්මංහන්දිය පොලිස් වසම.**

2024.02.12 වන දින රාත්‍රී කාලයේ ඌරගස්මංහන්දිය පොලිස් වසමේ මැන්ඩෝරාවල ප්‍රදේශයේදී පොල්ලකින් පහරදී පුද්ගලයෙකු ඝාතනය කර ඇති බවට ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 51 ක්වූ මැන්ඩෝරාවෙල, ඌරගස්මංහන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම පහරදීම සිදුකර ඇති බවට අනාවරණය වන අතර පහරදීම සිදුකල වයස අවුරුදු 43 ක් වන එම ප්‍රදේශයේම පදිංචි සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගිරිබාව පොලිස් ස්ථානය.**

2024.02.13 වන අද දින උදෑසන කාලයේ ගිරිබාව පොලිස් වසමේ කටියාව ප්‍රදේශයේදී ගිරිබාව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකරන ලද වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන තඹුත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ගිරිබාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. රිය අනතුරක් - මාන්කුලම් පොලිස් වසම.**

2024.02.12 වන දින සවස් කාලයේ මාන්කුලම් පොලිස් වසමේ කෝකාවිල් කිලෝමීටර් 239 – 240 ත් කණුව අතර ප්‍රදේශයේ යුද හමුදා කඳවුර ඉදිරිපිටදී වව්නියාව දෙස සිට යාපනය දෙසට ධාවනය වූ ශ්‍රී ලංකා යුද හමුදාවට අයත් ලොරි රථයක් එම කඳවුර දෙසට හැරවීමට යාමේදී පසුපසින් පැමිණි බස් රථයක් ගැටී අනතුරක් සිදු වී ඇත.

අනතුරින් බස් රථයේ ගමන් ගන්නා ලද රියදුරු ඇතුළු මඟීන් 05දෙනෙකු සුළු තුවාල ලබා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කර ඇති අතර යුද හමුදා නිලධාරීන් සිව්දෙනෙක්ද සුළු තුවාල ලබා යුද හමුදා කිලිනොච්චිය රෝහලේ ප්‍රතිකාර ලබයි.

මාන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.